පාඩම්:- නර්තනයේ ප්‍රවර්ධනයට දායක වූවෝ.

නර්තන කලාවේ ප්‍රවර්ධනය සඳහා දායක වූ ශිල්පීන් බොහෝ ය. ඒ අතර, ආචාර්ය වජිරා චිත්‍රසේන මහත්මිය හා ආචාර්ය මිරැන්ඩා හේමලතා මහත්මිය වැදගත් වේ.

1. ආචාර්ය වජිරා චිත්‍රසේන මහත්මිය



1932 මාර්තු මස 15 වන දින උපත ලද වජිරා චිත්‍රසේන මහත්මිය ශ්‍රී ලංකාවේ බිහි වූ නර්තන ශිල්පිනියක ලෙස කිරුළු පලඳා සිටින්නීය. චිත්‍රසේන මහතාගේ දයාබර බිරිඳව මෙතුමිය නර්තනය තම ජීවන වෘත්තිය ලෙස තෝරා ගත්තා ය.

1944 ආරම්භ කළ චිත්‍රසේන කලායතනය නර්තන ශිල්පීන් මෙන් ම උසස් නර්තන කලා නිර්මාණ බිහි වූ ආයතනයකි. චිත්‍රසේන මහතා ගෙන් නර්තනය හැදෑරූ ඇය එහි ජ්‍යේෂ්ඨ නර්තන ශිල්පිනිය වූවා ය. අවුරුදු 19 දී කුමුදිනී මුද්‍රා නාට්‍ය නිෂ්පාදනය කරමින් ළමා මුද්‍රා නාට්‍ය කලාවක් හඳුන්වා දීමේ ගෞරවය ද ඇයට හිමි වේ. එමෙන් ම රන් කිකිළි, ගිනි හොරා,සේපාලිකා යන මුද්‍රා නාට්‍ය නිෂ්පාදනය කරමින් ප්‍රේක්ෂකයන් අතර ජනාදරයට ද ලක් වූවා ය.

එකල උඩරට කාන්තා රංග වස්ත්‍රාභරණ කට්ටලය වූයේ වෙස් ඇඳුම හා සමානකම් දක්වන ඇඳුම් කට්ටලයකි.එය කාන්තාවන්ට සුදුසු නිර්මාණශීලී බවින් යුක්ත ඇඳුම් කට්ටලයක් ලෙස සකස් කිරීමට ඇය පුරෝගාමී වූවා ය. ඒ සඳහා එයට සහයෝගය ලබා දුන්නේ සෝමබන්දු විද්‍යාපති මහතා ය.

උඩරට නැටුමේ තාණ්ඩව ලක්ෂණ වලට ලාස්‍ය ලක්ෂණ මුසු කරමින් කකාන්තාවට උචිත නර්තන විලාසයකින් ඔප්නැංවෙන පරිදි ප්‍රසංග වේදිකාවේ නර්තන ඉදිරිපත් කිරීමට ඇයි සමත් වූවා ය.

1949 දී චිත්‍රසේන මහතා රචනා කළ රාවණා මුද්‍රා නාට්‍යය සඳහා පූජා නර්තනයෙන් මෙන්ම කරදිය, නල දමයන්ති මුද්‍රා නාට්‍ය සඳහා නර්තනයෙන් දායකත්වය දැක්වූවා ය. කරදිය මුද්‍රා නාට්‍යයේ සිසී ගේ චරිතය සහ නල දමයන්ති මුද්‍රා නාට්‍යයේ හංස ධේනුවගේ චරිතයට නර්තනයෙන් පණ පොවමින් ඇයගේ නර්තන ප්‍රතිභාව ලොවට හෙළි කිරීමට සමත් වූවාය.

2. ආචාර්ය මිරන්ඩා හේමලතා මහත්මිය



දේශීය නර්තන කලාවට සුවිශේෂී මෙහෙවරක් ඉටුකළ මිරන්ඩා හේමලතා මහත්මිය, 1938 නොවැම්බර් මස 15 වන දින කැලණිය දළුගම ග්‍රාමයේ උපත ලැබුවාය. පාසල් අධ්‍යාපනයෙන් පසු රජයේ ලලිත කලායතනයෙන් නර්තන අධ්‍යාපනය හැදෑරූ ඇය කොළඹ ක්‍රමය යටතේ ශිෂ්‍යත්වයක් හිමි කරගනිමින් භාරතයට ගොස් අඩයාර්හි "කලා ක්ෂේත්‍ර" ආයතනයෙන් භරත නර්තන සම්ප්‍රදාය ප්‍රගුණ කළාය. පසුකාලයේදී භරත නාට්‍ය ශිල්පිනියක වශයෙන් ද ප්‍රසිද්ධියට හා ජනප්‍රියත්වයට පත් වූවාය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රථම නර්තන අධ්‍යක්ෂිකා ධූරය දැරූ මෙතුමිය සුසමාහිත පෞරුෂයක් ඇති දරු පරපුරක් බිහි කිරීම උදෙසා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළා ය.ඒ අතර සමස්ත ලංකා නැටුම් තරග ක්‍රමවත්ව ආරම්භ කිරීම මෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය නර්තන කණ්ඩායමක් බිහි කිරීමත් නර්තන අධ්‍යාපනය ප්‍රවර්ධනයට ඇය කළ විශිෂ්ට මෙහෙයකි.

ගිරාගම ගුරු අභ්‍යාස විද්‍යාලයෙන් හා කටුකුරුන්ද ගුරු අභ්‍යාස විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක වශයෙන් කටයුතු කළ ඇය තමන්ගේ ශිල්ප ඥානය ගුරු සිසුන්ට ලබා දුන්නා ය.

ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය අධ්‍යක්ෂ ධූරය හෙබ වූ ඇය පාසල් අධ්‍යාපනය තුළ සෞන්දර්ය විෂය, යුගයේ අවශ්‍යතාවට ගැළපෙන අයුරින් සංවර්ධනය කිරීමට දායක වූවාය. ඒ අතර, ගුරු අත්පොත් සකස් කිරීම, විෂයමාලා සකස් කිරීම, ගුරු මාර්ගෝපදේශ සැකසීම, දූරස්ථ ගුරු පුහුණු නර්තන සම්මන්ත්‍රණ පැවැත්වීම ආදී සේවාවන් රැසක් ක්‍රියාත්මක කළාය. එමෙන්ම ඇය විසින් අ.පො.ස සා.පෙල හා උසස් පෙළ ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා ප්‍රායෝගික ඇගයීම් කටයුතු විධිමත් ලෙස සකස් කරවන ලදී.

නර්තන පිළිබඳ පොත්පත් හා ලිපි ගණනාවක් රචනා කළ මෙතුමිය දක්ෂ ලේඛිකාවක ලෙස ද දෙස් විදෙස් ගෞරවාදරයට පාත්‍ර වූවාය.

මෙතුමිය විසින් ආරම්භ කරන ලද" මිරැන්ඩා හේමලතා කලා ආශ්‍රමය"දේශීය නර්තනය මෙන්ම භරත නැටුම් පිළිබඳව හැදෑරීමට දේශීය දරුවන්ට තෝතැන්නකි. සංචාරී චලන, රංගධාරා, රංග රේඛා, නූපුර රාවය ආදී නර්තන ප්‍රසංග ද" තණ්හා ආශා" යන ඉගිනළුව ද නිර්මාණය කළ ඇය 1980 වර්ෂයේ දී මෝල් ගස් නැටුම ට නව රංග රටා නිර්මාණය කරමින් ජනප්‍රියත්වයට පත්කිරීමටද සමත් වූවාය.

මන්ද මානසික දරුවන්ගේ නර්තන කුසලතා ඔප් නැංවීම සඳහා ඔවුන්ට නර්තනය උගන්වා,එම දරුවන් සමාජගත කිරීමේ මහඟු මෙහෙවරක් ශ්‍රී ලංකාව තුළ පළමු වරට ආරම්භ කිරීමේ ගෞරවයෙන් ද ඇ පිදුම් ලබන්නීය.

1985 දී සොන්ටා ජාත්‍යන්තර සම්මානය,1988 දී කලාසූරි ජනාධිපති සම්මානය, ජාත්‍යන්තර කාන්තා දින සම්මානය ආදී සම්මාන රැසක් හිමිකරගෙන ඇත.ඒ අතට සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නර්තන හා නාට්‍ය කලා පීඨය මගින් නිර්දේශිත ව ඇගේ සේවය ඇගයීම් කර ඇයට දර්ශන සූරි උපාධිය ද පිරිනමන ලදී.

ඇගයීම:-

1. නර්තන කලාවේ ප්‍රවර්ධනය සඳහා දායක වූ ශිල්පීන් දෙදෙනෙකු නම් කරන්න.
2. වජිරා චිත්‍රසේන මහත්මිය නිෂ්පාදනය කළ මුද්‍රා නාට්‍ය පහක් නම් කරන්න.
3. මෙතුමිය නර්තනයෙන් දායක වූ මුද්‍රා නාට්‍ය මොනවාද?
4. ඒ අතරින් ඉතා සුවිශේෂී චරිත හා ඊට අදාල මුදා නාට්‍ය නම් කරන්න.
5. මිරැන්ඩා හේමලතා මහත්මිය උපත ලද්දේ කවදා කොහේදී ද?
6. මෙතුමිය භරත නාට්‍ය සම්ප්‍රදාය උගත්තේ කොහේදී ද?
7. නර්තනය ප්‍රවර්ධනය සඳහා මෙතුමිය කළ සුවිශේෂී මෙහෙයන් මොනවාද?
8. මෙතුමිය විසින් පවත්වන ලද නර්තන ප්‍රසංග මොනවාද?
9. මිරැන්ඩා හේමලතා මහත්මිය නිර්මාණය කළ ඉගි නළුව කුමක්ද?
10. මෙතුමිය හිමිකරගත් සම්මාන මොනවද?

පැවරුම:-

නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායක වූවන් පිළිබඳ තොරතුරු එක්රැස් කොට පොත් පිංචක් නිර්මාණය කරන්න.